වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

## முதியோர்களுக்கான தேசிய செயலகம்

## National Secretariat for Elders

www.srilankaeldercare.gov.lk

සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා -செயலூக்கமான முதுமையை நோக்கி Towards active ageing

| | |
|---|---|
| **ආරම්භක දිනය** | :- 2002.05.22 |
| **පනත** | :- 2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත. |
| **ආයතනයේ ස්වභාවය** | :- ව්‍යවස්ථාපිත මණ්ඩලයකි |
| **සෞභාග්‍යය දැක්ම අදාල වගන්තිය** | :- ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක් |
| **ප්‍රතිපාදන සැපයීම** | :- භාණ්ඩාගාර අරමුදල<br>වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල |



# ආයතනයේ කාර්යය භාරය

- අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70ට වැඩි, වැඩිහිටියන් වෙනුවෙන් වැඩිහිටි දීමනා සහ අවුරුදු 100ට වැඩි, වැඩිහිටියන් වෙනුවෙන් සියවස් පූර්ණ දීමනා ලබා දීම.
- වැඩිහිටියන් මුහුණ දෙන ප්‍රශ්න හඳුනා ගැනීම හා ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම.
- වැඩිහිටි දැනුම, කුසලතා, අත්දැකීම් භාවිතා කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සමාජ සංවර්ධනයක් ඇති කිරීම.
- සෞඛ්‍ය සම්පන්න වැඩිහිටිවියක් වෙනුවෙන් දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම.
- වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- වැඩිහිටි නිවාස ප්‍රමිතිකරණය.

# වැඩිහිටි ජනගහන තොරතුරු

| | |
|---|---|
| 2012 වැඩිහිටි ජනගහනය | මිලි. 2.5 |
| 2012 වැඩිහිටි ජනගහන ප්‍රතිශතය | 12.4% |
| වැඩිම වැඩිහිටි ජනගහනය කෑගල්ල දිස්ත්‍රික්කය | 14.9% |
| අඩුම වැඩිහිටි ජනගහනය මඩකලපුව දිස්ත්‍රික්කය | 2.6% |
| පුරුෂයින් | 1,115,651 (44.3%) |
| කාන්තාවන් | 1,404,922 (55.7%) |
| අවුරුදු 70 ට වැඩි ජනගහනය - ගැහැණු | 562,915 |
| අවුරුදු 70 ට වැඩි ජනගහනය - පිරිමි | 406,459 |
| 70 ට වැඩි මුළු ජනගහනය | ***969,374*** |

*(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - 2012 )*

# අයත්වන ආයතන වර්ග

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සතු ,

- කතරගම වැඩිහිටි නිවාසය .
- ගම්පහ මාලිගාතැන්න එච්ජින් නෝනා වැඩිහිටි නිවාසය.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත පාලනය වන,

- පන්නල වෙල්කම් විලේජ් වැඩිහිටි නිවාසය .

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් අධීක්ෂනය කරන,

- වැඩිහිටි නිවාස 345.

(පාලක සභා හා පෞද්ගලික ව්‍යාපාර ලෙස)

# වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව
# හා
# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

- 2011 අංක 5 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත මඟින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

- වැඩිහිටි තැනැත්තන්ගේ සුබසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමත් ඔවුන් හට ආත්ම ගෞරවයෙන් ස්වාධීනව ජීවත්විමට අවස්ථාව සලසා දීමත් ආයතනයේ කාර්යය භාර්යය වේ.

## දැක්ම

ශ්‍රී ලාංකික ජනතාවට රැකවරණය තුළින් ක්‍රියාකාරි,
ජවසම්පන්න හා ඵලදායි වැඩිහිටි දිවියක් උදා කිරිම.

## මෙහෙවර

වැඩිහිටියන්ගේ නිදහස, රැකවරණය, ආත්ම පරිපූර්ණත්වය,
සහභාගිත්වය හා අභිමානය සහතික කිරිමත්, සමාජ සංවර්ධන
කාර්යයන්හි
වැඩිහිටියන්ගේ සහභාගිත්වය උනන්දු කරවීමත් හා
දැනුවත් කිරිමේ වැඩසටහන් තුළින්
වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් රැක දීමත්
අපගේ මෙහෙවර වේ.

# අරමුණු

- වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
- වැඩිහිටියන් මුහුණ දෙන ප්‍රශ්න හඳුනා ගැනීම හා ඒ වෙනුවෙන් ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම.
- වැඩිහිටි දැනුම, කුසලතා, අත්දැකීම් භාවිතා කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සමාජ සංවර්ධනයක් ඇති කිරීම.
- සෞඛ්‍ය සම්පන්න වැඩිහිටිවියක් වෙනුවෙන් දැනුවත් කිරීම් පැවැත්වීම.
- අඩු ආදායම්ලාභී වැඩිහිටි පුරවැසියන් වෙනුවෙන් මාර්ගෝපදේශනය සහ සුභසාධනය ලබා දීම.
- වැඩිහිටියන්ට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම.

# ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාල මඟින් වැඩිහිටි සුබ සාධනය වෙනුවෙන් 2021වර්ෂයේ දී සිදු කරන සේවාවන්

- භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් සිදු කරනු ලබන සේවාවන්

- වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල මඟින් කරනු ලබන සේවාවන්

# 1. ස්වයං රැකියා අධාර ලබා දීම

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ දැනුම,කුසලතා හා ආකල්ප උපයෝජනය කරමින් ඔවුන් සක්‍රීයව ආර්ථික කටයුතු සඳහා දායක කර ගැනීම

එක් ස්වයං රැකියා ලාභියකු වෙනුවෙන් රු.මි 0.03ක උපරිමයකට යටත්ව වැඩිහිටියන් 500 සඳහා මූල්‍යාධාර ලබා දීම







## 2.1"ආරෝග්‍යා" සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීම

### නීරෝගී ආයු අපේක්ෂාවක් සහතික කිරීම

නිදන්ගත තෝරාගත් බෝ නොවන රෝගවලින් පෙළෙන වැඩිහිටියන් 1000ක් සඳහා රු.25,000 බැගින් මූල්‍යාධාර ලබා දීම





## 2.2 "සුවසහන" සෞඛ්‍ය වැඩසටහන -වැඩිහිටි නිවාස තුල ජීවත්වන වැඩිහිටියන්ගේ වෛද්‍ය පහසුකම් වෙනුවෙන් මුල්‍යාධාර සැපයීම

### නීරෝගී ආයු අපේක්ෂාව සහතික කිරීම

වෛද්‍ය අවශ්‍යතා වෙනුවෙන් නේවාසික වැඩිහිටියන් 10 ක් සඳහා රු.මිලි.0.05 ක උපරිමයකට යටත්ව





## 2.3 ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පත් නිකුත් කිරීම

වැඩිහිටියන් හට ප්‍රමුඛතාවය සැලසෙන පහසු පරිසරයක් නිර්මාණය කිරීම

ජංගම සේවා පැවැත්වීම තුලින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩිහිටි හැඳුනුම් පත් නිකුත්කිරීම








## 2.4 ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ශ්‍රවණ උපකරණ ලබා දීම

### වැඩිහිටි ප්‍රජාවගේ සෞඛ්‍ය තත්වය ප්‍රවර්ධනය

අඩු අදායම් ලාභී වැඩිහිටියන් වෙනුවෙන් ශ්‍රවණ උපකරණ 300ක් ලබා දීම





## 3.1 පන්නල වෙල්කම් විලේජ් ,මාලිගාතැන්න හා කතරගම වැඩිහිටි නිවාසය නඩත්තුව හා පරිපාලනය

### ගුණාත්මක වැඩිහිටි සත්කාර සේවාවන් ස්ථාපිත කිරීම

වැඩිහිටි නිවාසවල වැඩිහිටියන් සඳහා වඩා හොඳ පහසුකම් සැපයීම  වෙනුවෙන් වැඩිහිටි නිවාස නඩත්තුව හා පරිපාලනය








# 3.2 ප්‍රමිතිගතව වැඩිහිටි නිවාස ඉදිකිරීම් හා අළුත් වැඩියාව

ප්‍රමිතියට අනුකූල වැඩිහිටි නිවාස ස්ථාපිත කිරීම හා ගුණාත්මක වැඩිහිටි සත්කාර සේවාවක් ඇති කිරිම

වැඩිහිටි නිවාස 50ක් වෙනුවෙන් ඉදිකිරීම් හා අළුත්වැඩියාව සඳහා මූල්‍යාධාර සැපයීම හා කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීම







## 3.3 වසංගතය හමුවේ වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මූල්‍යාධාර ලබා දීම

වසංගතය හමුවේ වැඩිහිටි නිවාසගත වැඩිහිටියන් සුරක්ෂිත කිරීම

ඉල්ලීම් මත එක් වැඩිහිටියෙකු වෙනුවෙන් උපරිමය රු.2000/- වන ලෙස මූල්‍යාධාර ලබා දීම





# 4. වැඩිහිටි වන්දනා චාරිකා සඳහා මුල්‍ය පහසුකම් ලබා දීම

වැඩිහිටි ප්‍රජාවගේ අධ්‍යාත්මීය හා ස්වයං පරිපූර්ණතාවය සහතික කිරීම

වැඩිහිටි වන්දනා චාරිකා 100 ක් සඳහා මුල්‍ය පහසුකම් ලබා දීම (රු.මි.0.05*100)



# 5.1 "දිරිය පියස" නිවාස යෝජනා ක්‍රමය

සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම් පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම.

සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම් පවුල් වෙනුවෙන් නිවාස අළුත්වැඩියාව හා ඉදිකිරීම (නිවාස 50 * රු.මිලි.0.3)







# 5.2 "සුවපහසු" මූලාධාර යෝජනා ක්‍රමය

වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය හා සනීපාරක්ෂාව ඉහළ නැංවීම

වැඩිහිටියන් තම නිවස තුළ ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීම (එක් ප්‍රතිලාභියෙකුට උපරිමය රු.මිලි.0.05 වන පරිදි)







## 5.3 වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඉදිකිරීම හා උපකරණ ලබා දීම

වැඩිහිටි ප්‍රජාවගේ විවේකී කාලය වඩා ඵලදායීව යොදාගැනීම හා ආත්ම අභිමානය වර්ධනය කිරීම

දිවා මධ්‍යස්ථාන 50ක් ඉදිකිරීම(රු.මි.2.5*50) හා උපකරණ ලබා දීම








## 5.4 "දිවියට සවියක්" ව්‍යාපෘති යෝජනා ක්‍රමය

ඇවිදීමේ ආබාධ සහිත වැඩිහිටියන් හට ඇවිදීමට මගක් විවර කිරීම

ආබාධිත වැඩිහිටියන්ගේ භාවිතය වෙනුවෙන් ආබාධිත උපකරණ ලබා දීම.







# 5.5 වැඩිහිටි ග්‍රාමීය කමිටු සවිබල ගැන්විම

ඵලදායී ග්‍රාමීය කමිටු නිර්මාණය කිරීම හා කමිටු සවිබලගැන්වීම

එක් කමිටුවකට උපරිමය රු.100,000/-බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම කමිටු 3කට මුල්‍යාධාර ලබා දීම







# 6. වැඩිහිටි විෂයට අදාළව ප්‍රකාශන සිදු කිරීම

සමාජය තුල වැඩිහිටියා සහ වැඩිහිටි භාවය පිළිබඳව ධනාත්මක හා සංවේදී ආකල්ප ගොඩනැගීම උදෙසා අදාළ ප්‍රකාශන නිකුත් කිරීම.


වැඩිහිටියන්ට
අත හිත දෙන
ජංගම සේවා වැඩසටහන


කොරෝනා
වෛරසයෙන්
වැඩිහිටියන් බේරා ගනිමු

## 7. ආදරයයි - කරුණාවයි ළමා අපේ වැඩිහිටි ලෝකයයි වැඩසටහන ක්‍රියාත්මක කිරීම

වැඩිහිටියා හා වැඩිහිටි භාවය පිළිබඳව පාසල් සිසුන් තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන දියත් වේ.





## 8. ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සවය

ඔක්තෝබර් 01 වන දිනට යෙදෙන ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව වැඩසටහන් දියත් කිරීම.



## 9. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ නඩත්තු මණ්ඩලය

දරුවන් විසින් නොසලකා හැර ඇති දෙමාපියන් වෙත දරුවන්ගෙන් මාසිකව නඩත්තු මුදලක් ලබාදී ඔවුන්ගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම.



# 10. අවුරුදු 70 ට වැඩි ජ්‍යෝෂ්ඨ පුරවැසි දීමනාව හා අවුරුදු 100 ට වැඩි "සියවස් සපිරි" දීමන ලබාදීම

අඩු ආදායම්ලාභී වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන්ගේ සුභ සාධනය සැලසීම සඳහා මාසිකව රු. 2,000/- ක මුදලක් ලබාදීම හා වයස අවුරුදු 100 සපුරන ලද වැඩිහිටියන් වෙත මාසිකව රු. 5,000/- දීමනාව ලබාදීම.



# 11. “සුරකුම” ව්‍යාපෘති යෝජනා ක්‍රමය

දැනට පිහිටුවා ඇති දිවා සුරකුම් මධ්‍යස්ථාන ආශ්‍රිතව වැඩිහිටියන් විසින් කණ්ඩායම් වශයෙන් එකතුව සිදුකරනු ලබන ස්වයං රැකියා සඳහා එක් කණ්ඩායමකට රු. 50,000/- බැගින් වූ ආධාර ලබාදීම මේ යටතේ සිදු කෙරේ.





# 12. ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම් සඳහා ආධාර ලබාදීම

මේ යටතේ ග්‍රාමීය වැඩිහිටි කමිටු සවිබලගැන්වීම සඳහා භෞතික උපකරණ ලබාගැනීමට එක් සමිතියකට උපරිමය රු. 100,000/- ට යටත්ව ආධාර ලබාදීම.



# 13. "වත්කම" ව්‍යාපෘති යෝජනා ක්‍රමය

වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හා දැනුම ඒකරාශී කිරීම උදෙසා මේ යටතේ විශේෂ ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර ලබාදීම මේ යටතේ සිදු වේ.



වැඩිහිටි තැනැත්තන් සඳහා වන
ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய
சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

# முதியோர்களுக்கான தேசிய செயலகம்

# National Secretariat for Elders

www.srilankaeldercare.gov.lk

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා -செயலூக்கமான முதுமையை நோக்கி Towards active ageing*